# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,340 - 2023 ජූලි මස 07 වැනි සිකුරාදා - 2023.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 748 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත් කෙටුම්පත 2023 ජුනි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජූලි මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජූලි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


747 - B 082472 — 5,403 (2023/07)
F 1 -

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය

වයඹ පළාත් සභාවේ 1995 අංක 04 දරන වයඹ පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යවරයා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර ව වයඹ පළාතේ ආණ්ඩුකාරවර ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මා විසින් පනවනු ලබන නියෝග.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2023 ජුනි මස 27 වැනි දින දී,
කුරුණෑගල.

### නියෝග

1. මෙම නියෝග ''2023 වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා සංශෝධන නියෝග මාලාව'' ලෙස හඳුන්වනු ලබන අතර මෙම නියෝග මගින්, 1998 සැප්තැම්බර් මස 11 දිනැති අංක 1045 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග, 2004 ජනවාරි 16 දිනැති අංක 1324 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග, 2005 දෙසැම්බර් 22 දිනැති අංක 1424/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග සහ 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගවලින් සංශෝධිත 1996 නොවැම්බර් මස 08 දිනැති අංක 949 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග තවදුරටත් පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර, මෙම සංශෝධන නියෝග මාලාව *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට වයඹ පළාත සඳහා බලාත්මක වන්නේ ය.

2. 2005 දෙසැම්බර් 22 දිනැති අංක 1424/14 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 03.02 (අ)(ii), 03.02 (අ)(iii), 03.02 (අ)(iv) නියෝගවල සඳහන් මගී සේවා අවසර පත්‍ර සඳහා නියමිත වාර්ෂික ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 03.02 (අ) | (ii) | බලපත්‍රයක් අලුත් කිරීම | *රු. ශත* |
| | | සාමාන්‍ය සේවා බස් රථයක් සඳහා | 3,750 0 |
| 03.02 (අ) | (iii) | වායු සමනය කළ සුඛෝපභෝගී බස් රථයක් සඳහා වාර්ෂික ගාස්තුව | 5,000 0 |
| 03.02 (අ) | (iv) | වයඹ පළාත තුළ ධාවනයවන බස් රථයකට තාවකාලික බලපත්‍ර ගාස්තුව දිනකට | 250 0 |

3. 1998 සැප්තැම්බර් මස 11 දිනැති 1045 දරන *ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 03.02 (ආ)(i) ඉවත් කර ඒ වෙනුවට 03.02 (ආ) ලෙස අලුතින් නියෝගයක් එකතු කිරීමෙන් එකී නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 03.02 (ආ) | ඉල්ලුම්පත්‍රය සඳහා ගාස්තුව | *රු. ශත* |
| | එබඳු අවසර පත්‍රයක් ප්‍රථමවරට නිකුත් කිරීම හෝ අලුත් කිරීම | 100 0 |

4. 2004 ජනවාරි 16 දිනැති අංක 1324 දරන *ගැසට් පත්‍රයේ* 03.02 (ඇ) හි සඳහන් ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමෙන් ද එකී 03.02 (ඇ) (ii) ට පසුව 03.02 (ඇ) (iii), 03.02 (ඇ) (iv) අනු නියෝග එකතු කිරීමෙන් ද එකී 03.02 (ඇ) නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (1) 03.02 (ඇ) | | මගී සේවා අවසර පත්‍රයක අනු පිටපතක් නිකුත් කිරීම සඳහා, | *රු. ශත* |
| | (i) | අවසර පත්‍ර පොත සඳහා | 5,000 0 |
| | (ii) | අවසර පත්‍ර ලේබලය සඳහා | 1,000 0 |
| (2) 03.02 (ඇ) | (iii) | ඔමිනි ලිපි නිකුත් කිරීම | 1,000 0 |
| 03.02 (ඇ) | (iv) | නිල ලාංඡන | 200 0 |

5. 2004 ජනවාරි 16 දිනැති අංක 1324 දරන *ගැසට් පත්‍රයේ* 03.02 (ඉ) වගන්තියෙ හි සඳහන් ''මගී සේවා අවසර පත්‍රයක සංශෝධනයක්'' ලෙස අය කළ ගාස්තුව මින් ඉදිරියට ''මාර්ග දිගුව'' වශයෙන් අය කරන අතර ''මගී සේවා අවසර පත්‍රයක සංශෝධනයක්'' නමින් සිදු කරන සේවාව මින් ඉදිරියට අත්හිටුවනු ලැබේ. එකී ''මාර්ග දිගුව'' සඳහා පහත සඳහන් ගාස්තු නියම කිරීමෙන් ද එකී වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

03.02 (ඉ) මාර්ග දිගුවක් සඳහා,

| | රු. ශත |
|---|---|
| A වර්ගයේ මාර්ගය | 50,000 0 |
| B වර්ගයේ මාර්ගය | 25,000 0 |
| ග්‍රාමීය මාර්ග/අති දුෂ්කර | 5,000 0 |
| සිසු සැරිය සඳහාම පමණක් වෙන් වූ මාර්ග | 25,000 0 |

6. 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *ගැසට් පත්‍රයෙහි* 03.02 (ඊ) ඉවත් කර ඒ වෙනුවට 03.02 (ඊ) (i) සහ (ii) ලෙස ආදේශ කිරීමෙන් එකී නියෝග පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 03.02 (ඊ) | (i) අමතර ගමන් වාරයක් සඳහා (මාසිකව) පළාත තුළ | 2,000 0 |
| | (ii) අමතර ගමන් වාරයක් සඳහා (මාසිකව) අන්තර් පළාත් | 2,000 0 |

7. ඉහත (6) නියෝගයෙහි සඳහන් 03.02 (ඊ) අනු නියෝගයට පසුව 03.02. (උ) 03.02 (ඌ) ලෙස අලුතින් අනු නියෝග ඇතුළත් කිරීමෙන් එකී 03.02 වගන්තිය පහත පරිදි සංශෝධනය වේ.

| | | | රු. ශත |
|---|---|---|---|
| 3.02 | (උ) | විශේෂ චාරිකා ගාස්තු<br>(වැඩිවන සෑම දිනකටම රු. 100 බැගින් අය කරනු ලැබේ.) | 500 0 |
| | (ඌ) | මාර්ගයක නිත්‍ය සේවාවේ ධාවනය වන මගී අවසර පත්‍රයක එම මාර්ගයේ ම ගමන් ආරම්භය සහ ගමනාන්තය සංශෝධනය කිරීමේ දී රු. 50,000 ගාස්තුවක් අය කෙරේ. | |

8. 2004 ජනවාරි 16 දිනැති අංක 1324 දරන ගැසට් පත්‍රයේ 5.11 හි සඳහන් රු. 450 ක් යන ගාස්තුව රු. 1500 ක් යනුවෙන් සංශෝධනය කිරීමෙන් සහ එකී නියෝගයට පහත සඳහන් අනු නියෝග එකතු කිරීමෙන් එකී නියෝග පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | | රු. ශත |
|---|---|---|---|
| 5.11 | (i) | රියැදුරු පුහුණු ගාස්තුව | 800 0 |
| | (ii) | රියැදුරු ප්‍රවීණතා ගාස්තුව | 500 0 |

9. 2004 ජනවාරි 16 දිනැති අංක 1324 දරන *ගැසට් පත්‍රයේ* 07.02 (ඌ) හි සඳහන් පරිදි 07.02 (ඌ) අනු නියෝගයෙහි අවසාන පේළියේ සඳහන් රු. 500.00 ක් වෙනුවට රු. 1,500.00 ක් ලෙස සංශෝධනය කිරීමෙන් සහ එකී 07.02 (ඌ) අනු නියෝගයට ඉක්බිතිව 07.02 (එ) ලෙස අලුතින් අනු නියෝගයක් ඇතුළත් කිරීමෙන් ද එකී නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | | රු. ශත |
|---|---|---|---|
| 07.02 | (එ) | කොන්දොස්තර පුහුණු ගාස්තුව | 800 0 |

10. 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* 11.03 හි සඳහන් ''මාසික සේවා ගාස්තුව'' යන්න මාසික ධාවන සටහන් පත්‍ර සේවා ගාස්තුව'' ලෙස සංශෝධනය කිරීමෙන් ද එකී මාසික ධාවන සටහන් පත්‍ර සේවා ගාස්තුව පහත පරිදි සංශෝධනය කිරීමෙන් ද එකී 11.03 නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 11.03 | මාසික ධාවන සටහන් පත්‍ර සේවා ගාස්තුව එක් එක් බස් රථයක් සඳහා | 1,500 0 |

11. 2004 ජනවාරි 16 දිනැති අංක 1324 දරන *ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 11.04 ද, 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 11.04 (එ) ද ඉවත් කර ඒ වෙනුවට 11.04 (අ) සිට 11.04 (ර) දක්වා අනු නියෝග එකතු කිරීමෙන් එකී 11.04 නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | | | රු. ශත |
|---|---|---|---|
| 11.04 | (අ) | මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍රයක් නොලබා මගී ප්‍රවාහනයේ යෙදීම | 5,000 0 |
| | (ආ) | මගී ප්‍රවාහන අවසර පත්‍රයේ සඳහන් වන නිශ්චිත මාර්ගයේ ධාවනය නොකිරීම. | 1,000 0 |
| | (ඇ) | බස් රථ නියමිත ගමනාන්තය දක්වා ධාවනය නොකර අතරමග හැරවීම හෝ අතර මගින් ගමන් ආරම්භ කිරීම | 2,000 0 |
| | (ඈ) | නියමිත කාල සටහනට අනුව ධාවනය නොකිරීම | 1,000 0 |
| | (ඉ) | මාර්ගස්ථ මගී ලේබලය/මාසික ධාවන සේවා පිවිසුම්පත ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය නොකිරීම. | 1,000 0 |
| | (ඊ) | මගීන්ගෙන් අයකරනු ලබන ගාස්තුව සඳහා මගී ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම | 1,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| (උ) | අය කරනු ලබන ගාස්තු චක්‍රය බස් රථය තුළ ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| (ඌ) | මාර්ග අංකය/ගමනාරම්භය/ගමනාන්තය ඉදිරිපස හා පිටුපස මහජනයාට පෙනෙන පරිදි ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| (එ) | වයඹ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිල ලාංඡනය ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| (ඒ) | බස් රථයේ අනුමත මගීන් සංඛ්‍යාව ප්‍රදර්ශනය නොකිරීම | 1,000 0 |
| (ඔ) | බස් රථයේ අනුමත මගීන් සංඛ්‍යාවට වඩා මගීන් ගෙනයාම | 1,000 0 |
| (ඕ) | කොන්දොස්තර බලපත්‍රය නොමැති අයෙකු සේවයේ යෙදවීම | 1,000 0 |
| (ක) | අධිකාරියේ ලියාපදිංචි නොවූ රියැදුරු මහතෙකු සේවයේ යෙදවීම | 1,000 0 |
| (ග) | මාසික ධාවන සටහන් පත්‍ර/පිවිසුම් පත්‍ර නොමැතිව බස් රථය ධාවනය කිරීම | 1,000 0 |
| (ච) | 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ II කොටසෙහි 20 වන වගන්තියෙහි 03 වන උප වගන්තියෙහි සඳහන් පරිදි බස් රථයක් ලෙස නිර්වචනය කර ඇති වාහනයක් හැරුණු විට වෙනත් වාහනයක් මගී ප්‍රවාහනයට යොදා ගැනීම | 1,000 0 |
| (ජ) | නියත සේවා අවසර පත්‍රයේ කාලය අවසන් වී තිබියදී සේවයේ යෙදීම සහ යෙදවීම | 1,000 0 |
| (ට) | අධිකාරියේ අවසරයක් නොමැතිව විශේෂ කුලී ගමන් හෝ සුභ සාධක චාරිකා වල යෙදීම | 1,000 0 |
| (ඩ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අවසර පතක් නොමැතිව කර්මාන්ත ශාලා ඇතුළු විශේෂ මගී ප්‍රවාහන සේවාවල නියැලීම | 1,000 0 |
| (ණ) | දුර ගමන් සේවා බස් රථ අනුමත ස්ථානවල හැර වෙනත් ස්ථානවල මගීන් ගැනීම හා බැස්ස වීම | 1,000 0 |
| (ත) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ලියාපදිංචි නොවී පාසල් සේවාවල නියැලීම | 1,000 0 |
| (ද) | බස් රථයේ අනුමත ආසන සංඛ්‍යාවට වඩා වැඩියෙන්/ අඩුවෙන් තිබීම | 1,000 0 |
| (න) | නිල ඇඳුම් පැළඳ නොසිටීම | 1,000 0 |
| (ප) | අනාවරණය වන වෙනත් වැරදි | 1,000 0 |
| (බ) | නොනවත්වා ධාවනයේ යෙදීම | 1,000 0 |
| (ම) | මාර්ග බලපත්‍රය බස් රථයේ නොමැතිව ධාවනය කිරීම | 1,000 0 |
| (ය) | කොන්දොස්තර බලපත්‍රයේ කාලය අවසන් වී තිබිය දී සේවයේ යෙදීම සහ යෙදවීම | 1,000 0 |
| (ර) | රියැදුරු බලපත්‍රයේ කාලය අවසන් වී තිබිය දී සේවයේ යෙදීම සහ යෙදවීම | 1,000 0 |

12. 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 11.05 වගන්තියෙහි සඳහන් ''සේවා ගාස්තුව'' යන්න ''මාසික පිවිසුම් පත්‍ර සේවා ගාස්තු'' ලෙස සංශෝධනය කිරීමෙන් එකී 11.05 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(3) 11.05

මාසික පිවිසුම් පත්‍ර සේවා ගාස්තු රු. 1,500.00 ක් ද වයඹ පළාත් බලසීමාවට අයත් කිලෝමීටරයකට අඩු ප්‍රමාණයක් තුළ ධාවනය වන බස්රථ සඳහා පිවිසුම් පත්‍ර ගාස්තු රු. 800.00 ක් ලෙස අයකරනු ලැබේ.

13. 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත ගාස්තු ද 16 (අ), (උ), (ඒ), (ඔ)හි සඳහන් ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමෙන් ද එකී 16 (අ) හි අනු අංක 8 ට පසුව 9 සිට 12 දක්වා අනු අංක එකතු කිරීමෙන් ද එකී අනු නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) 16 (අ)

| *අනු. අංකය* | *වාහන පංතිය* | *සංශෝධනය වීමට යෝජිත ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1. | යතුරු පැදි A | 3,000 0 |
| 2. | ත්‍රීරෝද රථ B1 | 4,500 0 |
| 3. | සැහැල්ලු වාහන B | 11,200 0 |
| 4. | පුහුණුව රහිත සැහැල්ලු වාහන B | 5,000 0 |
| 5. | බර වාහන D | 15,000 0 |
| 6. | පුහුණුව රහිත බර වාහන D | 7,500 0 |
| 7. | පෙර පුහුණු පරීක්ෂාව | 1,000 0 |
| 8. | සංස්කරණ පුහුණු (පැයකට) | 2,000 0 |

| | | | රු. ශත |
|---|---|---|---|
| (1) 16 (අ) | 9. | යතුරු පැදි/ත්‍රීරෝද රථ AB 1 | 6,000 0 |
| | 10. | යතුරු පැදි/ත්‍රීරෝද රථ/සැහැල්ලු වාහන AB 1 B | 15,200 0 |
| | 11. | ත්‍රීරෝද රථ/සැහැල්ලු වාහන B 1 B | 13,900 0 |
| | 12. | යතුරු පැදි/සැහැල්ලු වාහන AB | 13,200 0 |

16. (උ) බලපත්‍ර ලබා දීමේ දී ටෙන්ඩර් පටිපාටියට අනුව නියම කරනු ලබන අවම ලංසු මුදල පහත සඳහන් අයුරින් සංශෝධනය කරනු ලබන අතර ඒ සඳහා මාර්ග වර්ගීකරණය අනුව පහත සඳහන් ගාස්තු අය කෙරේ.

| | | රු. ශත |
|---|---|---|
| A | මාර්ගයක් සඳහා | 1,000,000 0 |
| B | මාර්ගයක් සඳහා | 750,000 0 |
| C | මාර්ගයක් සඳහා | 500,000 0 |
| D | මාර්ගයක් සඳහා | 250,000 0 |

16. (ඒ) නව බලපත්‍ර ටෙන්ඩර් කිරීමේ දී ටෙන්ඩර් කොන්දේසි ආරක්ෂා කිරීම පිණිස රු. 100,000 ආපසු ගෙවන ඇප තැන්පතු මුදලක් අයකරනු ලැබේ. යම් හෙයකින් බලපත්‍රලාභියෙකු බලපත්‍රය ලබා නොගතහොත් එම ඇප තැන්පත් මුදල ආපසු නොගෙවා අහෝසි කර ආදායම් ශීර්ෂයට බැර කරනු ලැබේ.

16. (ඔ) මාසික ධාවන සටහන් පත්‍ර හා පිවිසුම් පත්‍ර අමතර ගමන්වාර සඳහා ප්‍රමාද ගාස්තු වශයෙන් අය කළ 10% අධිභාරය සෑම මසකම 1 දින සිට 10 දක්වා 25% දක්වා ද 10 දින සිට 30 දින දක්වා 50% ක අධිභාරයකට යටත් ව ගාස්තු අය කරනු ලැබේ.

14. 2005 දෙසැම්බර් මස 22 දිනැති අංක 1424/14 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 16(ඌ) හි සඳහන් ගාස්තු සංශෝධනය කිරීමෙන් එකී අනු නියෝග පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

16(ඌ)

(i) අයිතිය විධිමත් කිරීමේ දී මාර්ග වර්ගීකරණයට අනුව පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලබන අතර බස්රථ පමණක් වෙනස්වන අවස්ථාවන් හි බලපත්‍ර ගාස්තු පමණක් ද

| | | රු. ශත |
|---|---|---|
| A | මාර්ගයක් සඳහා | 500,000 0 |
| B | මාර්ගයක් සඳහා | 300,000 0 |
| C | මාර්ගයක් සඳහා | 200,000 0 |
| D | මාර්ගයක් සඳහා | 100,000 0 |

(ii) එකම පවුලේ මව/පියා, සොයුරු/සොයුරියන් අතර බලපත්‍ර අයිතිය විධිමත් කිරීමේ දී බලපත්‍ර ගාස්තුවලට අමතරව රු. 25,000 ක මුදලක් අය කරනු ලැබේ. කලත්‍රයා මියගිය විට මාස 06 ක් ඇතුළත අයිතිය විධිමත් කිරීමේ දී බලපත්‍ර ගාස්තුවට අමතරව රු. 5,000 0 ක සේවා ගාස්තුවක් අය කළ යුතු අතර මාස 06 ක් ඉක්ම වූ විට ඥාතීත්වය මත අය කරනු ලබන ගාස්තු අය කරනු ලැබේ.

15. ඉහත 14 හි සඳහන් 16 (ඌ) අනු නියෝගයට අනුව 16 (ඔ), 16 (ඕ) ලෙස අලුතින් අනු නියෝග එකතු කිරීමෙන් ද එකී 16 නියෝගය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

16 (ඔ) (i) සිසුසැරිය නව මාර්ග ලබා දීමේ දී /අයිතිය විධිමත් කිරීමේ දී බලපත්‍ර ගාස්තුවට අමතරව පහත සඳහන් ගාස්තු අය කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| A | මාර්ගයක් සඳහා | 200,000 0 |
| B | මාර්ගයක් සඳහා | 150,000 0 |
| C | මාර්ගයක් සඳහා | 100,000 0 |

අන්තර් පළාත් සිසු සැරිය මාර්ග බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීමේ දී ඉහත සඳහන් මාර්ග වර්ගීකරණය යටතේ අදාළ ගාස්තු අය කෙරේ.

(ii) සිසුසැරිය මාර්ග සමීක්ෂණ ගාස්තු සඳහා කිලෝමීටර් 25 ට අඩු මාර්ග සඳහා රු. 5,000 0 ක් ද, කිලෝමීටර් 25ට වැඩි වන මාර්ග සඳහා පළමු කිලෝමීටර් 25 වෙනුවෙන් රු. 5,000 0 ක් වැඩි වන සෑම කිලෝමීටරයකට ම රු. 250 0 බැගින් අය කෙරේ.

(iii) ගැමිසැරිය නව බලපත්‍ර සඳහා බලපත්‍ර ගාස්තුවට අමතරව රු. 100,000 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

(iv) සිසුසැරිය සහ ගැමිසැරිය මාසික ධාවන සටහන් පත්‍ර සේවා ගාස්තුව සඳහා මසකට රු. 1,000 මුදලක් අය කරනු ලැබේ.

(v) සිසුසැරිය සහ ගැමිසැරිය මාසික ධාවන සටහන් පත්‍රය සඳහා ප්‍රමාද ගාස්තු වශයෙන් අධිභාරය සෑම මසකම 1 දින සිට 10 වන දින දක්වා 25% ද, 10 වන දින සිට 30 වන දින දක්වා 50% ක අධිභාරයකට යටත්ව සේවා ගාස්තු අය කරනු ලැබේ.

(5) 16 (ඕ) අතිශයින් දුෂ්කර මාර්ගයන් හි පොදු මගී ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම අරමුණු කරගෙන බස්රථ, ලොරි රථ, ද්විත්ව කාර්ය වාහන සඳහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ දී පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ. ඉහත කී ලොරි රථ, ද්විත්ව කාර්ය වෙනුවට බස් රථයක් ආදේශ කරන්නේ නම් එම බස් රථය සඳහා මාර්ග බලපත්‍ර නිකුත් කිරීමේ දී ගැමි සැරිය සේවාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තු වන රු. 100,000 ක මුදලක් අය කරනු ලැබේ.

| | | *රු.* | *ශත* |
|---|---|---|---|
| (i) | අතිශයින් දුෂ්කර මාර්ගයන් හි නව බලපත්‍රයක් නිකුත් කිරීම/අයිතිය විධිමත් කිරීම | 30,000 | 0 |
| (ii) | ඥාතීත්ව පදනම මත අයිතිය විධිමත් කිරීම සඳහා | 10,000 | 0 |
| (iii) | දුෂ්කර සේවා මාර්ග බලපත්‍ර අලුත් කිරීම | 1,875 | 0 |
| (iv) | මාසික ධාවන සටහන් සේවා ගාස්තු | 600 | 0 |
| (v) | අතිශය දුෂ්කර මාසික ධාවන සටහන් පත් ප්‍රමාද ගාස්තු (මසකට) | 100 | 0 |
| (vi) | නිල ලාංඡන | 200 | 0 |

16. 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත 03 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(3) 3 වන වගන්තියෙ හි රියැදුරු සහ කොන්දොස්තරවරු විසින් පාවිච්චි කළ යුතු නිල ඇඳුම මෙහි පහත පළමු වන උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති නිල ඇඳුම විය යුතු අතර එකී නිල ඇඳුමෙහි අධිකාරිය විසින් නියම කරනු ලබන නිල ලාංඡනය සෑම අවස්ථාවකම පැළඳිය යුතු වේ.

17. 2012 ඔක්තෝබර් මස 15 දිනැති අංක 1780/05 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත 12 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

නිල ඇඳුම සම්බන්ධයෙන් පනවා ඇති නියෝග කඩකරන රියැදුරන් සහ කොන්දොස්තරවරු එම කොන්දේසි කඩ කරන සෑම අවස්ථාවක ම රු. 1,000 ක සේවා ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

18. මෙම සංශෝධිත නියෝග මාලාවේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි පාඨයන් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලාත්මක වන්නේ ය.

**පළමුවන උපලේඛනය**

*නිල ඇඳුම* :- අත් කොට සාමාන්‍ය ටී-ෂර්ටයකි. නිල ඇඳුම සම්පූර්ණයෙන් ම තැඹිලි සහ කහ වර්ණයෙන් අධිකාරියේ නිල ලාංඡනය සහිත විය යුතුය.



# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|

**2023 වර්ෂය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ජූලි** | 2023.07.07 | සිකුරාදා | 2023.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.07.14 | සිකුරාදා | 2023.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.07.21 | සිකුරාදා | 2023.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.07.28 | සිකුරාදා | 2023.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2023.08.04 | සිකුරාදා | 2023.07.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.08.11 | සිකුරාදා | 2023.07.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.08.18 | සිකුරාදා | 2023.08.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.08.25 | සිකුරාදා | 2023.08.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2023.09.01 | සිකුරාදා | 2023.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.08 | සිකුරාදා | 2023.08.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.15 | සිකුරාදා | 2023.09.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.22 | සිකුරාදා | 2023.09.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.27 | බදාදා | 2023.09.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.